2022 නොවැ 26 දින රජරට විශ්වවිද්‍යාලයේදී පැවති 64 වන සංවත්සර සභාවේ සිදු කළ

## සංගමයේ ව්‍යවස්ථාව සංශෝධනය

**01. 11.** වන වගන්තිය: සාමාජිකත්වය යටතේ පහත සඳහන් ඡේදය "H" වශයෙන් ඇතුලත් කරනු ලැබේ.

**2012.10.26** දින ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අමරදේව ශාලාවේ දී ගන්නා ලද තීරණය නැවත සංශෝධනය කර සාමාජිකයින්ගේ අවධාරණයට ඉදිරිපත් කරමි.

කිසියම් දේශපාලන වෘත්තීය සමිතියක හෝ ශාඛාවක ප්‍රධාන තනතුරක් දරන නිළධාරියෙක්/නිළධාරිණියක ට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ලිපිකාර, කළමනාකරණ සහකාර හා කාර්මික සේවා සංගමයේ හෝ ශාඛාවක ප්‍රධාන නිළයක් වසර 02ක් යනතුරු හා සංගමයේ ප්‍රධාන නිළයකට වසර 05ක් යනතුරු පත්විය නොහැකිය.

## සුභසාධක යෝජනා ක්‍රමය ව්‍යවස්ථා සංශෝධනය සංගමය

04. 04 සාමාජික මුදල

(අ) සුභසාධක යෝජනා ක්‍රමයේ සාමාජික මුදල මසකට රු. 100.00

(සංශෝධනය)

(ආ) සෑම සාමාජිකයෙකු විසින් ම මාස් පතා සිය දායක මුදල වශයෙන් රුපියල් 125.00ක් ගෙවිය යුතුය. සාමාජිකයාගෙන් ලත් පූර්ව අනුමැතිය පරිදි මාස්පතා වැටුප් පත මගින් සාමාජික මුදල අය කර ගැනීම ප්‍රධාන භාණ්ඩාගාරික හා ශාඛා භාණ්ඩාගාරික සතු වගකීමකි. මෙහි දැක්වෙන මුදල් ප්‍රමාණය වාර්ෂික මහසභා රැස්වීමක දී හෝ විශේෂ මහසභා රැස්වීමේ දී වෙනස් කළ හැකිය.

05. 05. 01 ආධාර ක්‍රමය (පැරණි ව්‍යවස්ථාව)

(ආ) සාමාජිකයකුගේ මවගේ, පියාගේ හෝ කලත්‍රයාගේ මවගේ පියාගේ යන අයගෙන් හතර දෙනාට සහ කලත්‍රයාගේ අභාවයක දී රු. 10,000/-

(සංශෝධනය)

(ආ) සාමාජිකයකුගේ මවගේ, පියාගේ හෝ කලත්‍රයාගේ මවගේ පියාගේ යන අයගෙන් හතර දෙනාට සහ කලත්‍රයාගේ අභාවයක දී රු. 10,000/- සිට රු. 12,500/- දක්වා වැඩි කිරීම.

(ඇ) සාමාජිකයෙකුගේ, මාස 06 කට වැඩි, අවිවාහක දරුවකගේ අභාවයක දී රු. 7500.00 සිට රු. 10,000.00 දක්වා වැඩි කිරීම

(ඈ) සාමාජිකයෙකුගේ, මාස 01 ට නොඅඩු, මාස 06 කට නොවැඩි දරුවකගේ අභාවයක දී රු. 5000.00 සිට රු. 7500.00 දක්වා වැඩි කිරීම

11. සුභ සාධක සංගමයේ සාමාජිකත්වය ලබා වර්ෂ 05 ක් ඉක්ම වූ පසු පහත සඳහන් ආකාරයට විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ගෙවීම් කරනු ලැබේ.

- වර්ෂ 05 සිට වර්ෂ 10 දක්වා රු. 10,000.00
- වර්ෂ 10 සිට වර්ෂ 20 දක්වා රු. 20,000.00
- වර්ෂ 20 සිට වර්ෂ 30 දක්වා රු. 30,000.00
- වර්ෂ 30 ට වැඩි නම් රු. 35,000.00

Scanned with CamScanner